
ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 සැප්තැම්බර් 10 සඳුදා
04 වෙළුම - 46 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය




## විශ්වාසයේ වසරට සූදානම් වෙමු

### පුංචි අපිත් අපේ විශ්වාසයේ දිවිය වර්ධනය කර ගනිමු

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# හොඳ කතෝලික නිර්මාණ කරුවෙක්වන්නට පුංචි ඔබට පුළුවන්.

## ආදරණීය දුවේ පුතේ...

දැන් සාහිත්‍ය මාසය ඇරඹුනා. හැම වසරකම සැප්තැම්බර් මාසය සාහිත්‍ය මාසය වශයෙන් නම් කිරීම තුළම පොත පත කියවීමේ ඇති මාහැගි බව පිළිබඳව අපට හොඳ මතකයක් ඇති කරවනවා. කුඩා කාලයේ පටන් පොතපතට ආදරය කරන අය, ඒ පොත පත කියවන අය අනාගතයේ හොඳ නිර්මාණ කරුවන් බවට පත්වෙනවා. ඒ නිර්මාණ කරුවන් අතරින් හොඳ ලේඛකයන් බිහි වෙනවා. ඒ ලේඛකයන් ලෝකයක් වෙනස් කරනවා. ලෝකය සංවේදී බවට පත් කරනවා.

ආදර දුවේ පුතේ හොඳ ලේඛකයකු වීමට නම් හොඳ නිර්මාණ කරුවෙක් වීම අත්‍යවශ්‍යයි. ලිවීම පමණක්ම අරමුණු කරගෙන සාමාන්‍ය ලේඛකයෙකු වීමට සිතනවාට වඩා, නිර්මාණාත්මක ශක්තියෙන් හෙබි ලේඛකයකු වීමට ඉටා ගැනීම ඉතා වටිනවා. නිර්මාණශීලී ලේඛකයකු වීමට නිවහල් නිදහස් සිතිවිලි සංකල්ප වගේම හොඳ පරිකල්පනයකින් හෙබි ආධ්‍යාත්මික පුද්ගලයෙක් වීමත් අත්‍යවශ්‍යයි. ඒ වගේම ප්‍රායෝගික අත්දැකීම් තුළින් සමාජයේ විනිවිද යන හැඟුම් ධාරාවන් සොයා ගවේෂනය කරමින් ඒ අත්විඳීම් ලේඛනයට ඉවහල් කර ගැනිමේ හොඳ පරිණත අත්දැකීමකුත් තිබිය යුතුයි. ඒ වගේම විශ්ව භාෂාවක් ප්‍රගුණ කිරීමේ දැඩි ඕනෑකමත් ඒ තුළින් විශ්ව සාහිත්‍යයට ඇළුම් කිරීමත් ඉතා වටිනවා.

ආදර දුවේ පුතේ, අද අප දේශයේ හොඳ කතෝලික ලේඛකයන් ඉතා විරල මට්ටමකයි ඉන්නේ. කතෝලික පොත පත, කතෝලික සාහිත්‍ය, කතෝලික විශ්ව සාහිත්‍ය අපේම භාෂාවෙන් වඩ වඩාත් ලේඛනගත විය යුතු යුගයකයි, අපි අවශ්‍යයෙන්ම පසු වන්නේ. මේ පුළුල් තලයේ හොඳ පරිශිලනයක් අපේ කුඩා දරුවන්ට දයාද කරන්නට තිබෙන අවකාශය අද සීමා සහිත වෙලා.

ඥානාර්ථ ප්‍රදීපය පුවත් පතට අවුරුදු 150 ක් පිරෙන සංවත්සර උත්සවයට තව තිබෙන්නේ අවුරුදු 2ක් තරම් කෙටි කාලයක්. එය නිමිත්ත කරගෙන වැඩි වැඩියෙන් විවිධ ක්ෂේත්‍රවල මාතෘකා යටතේ ලියැවුනු කතෝලික පොත් රාශියක් කතෝලික ජනයා අත තබන්නට දැන් හොඳ අඩිතාලමක් ප්‍රදීපය කතෝලික පුවත් පත හරහා දමමින් පවතිනවා. මෙය කාලෝචිත හොඳ වැඩපිළිවෙලක් බවට පත් කර ගන්නට පුංචි ඔබේ ඇප උපකාරයත් අත්‍යවශ්‍යයි. විශ්ව කතෝලික සාහිත්‍යයේ හොඳ ලේඛන කෘති වන , ''ද රෝබ්'' , ''සිල්ව චැලිස්'', ''ක්‍යුවෝ වාඩිස්'', ''පෝන්වස් පයිලට්'', ''හෙලන් ඔෆ් ට්‍රෝයි'', ''ස්පාර්ටකස්'' , ''බෙන්හර්,'' ''ටෙන් කමාන්ඩ්මන්ඩ්'' , ''ද ස්ටෝරි ඔෆ් පබියොලා'', ''මාජිනලයිස්ඩ් ජූ'' වැනි කෘති ඉතා සරලව දැන් සිංහලට නැගිය යුතුයි. පෙර කල මින් සමහරක් සිංහලට නැගී තිබුනත් දැන් එහි පිටපත් පවා සොයා ගැනීම ඉතා උගහටයි. ඒ පමණක් නොවෙයි. සාන්තුවර බැතිය ඔප් නංවන සාන්තුවර චරිත කථා , ප්‍රබල කතෝලික චරිතාපදන වැනි දැ වඩවඩාත් සිංහලෙන් ලියවිය යුතුයි. පෙර කල අපේ සිටි කතෝලික එඩිතර ලේඛකයන් වු සග සැපත් අති උතුම් එඩ්මන්ඩ් පිරිස් හිමි, දොන් පීටර් පියතුමා, ඩී.ජේ. ඇන්තනි පියතුමා, මෝසස් පෙරේරා මාහිමි වැනි උදාර ලේඛකයන්ගේ කැප වීමෙන් ශක්තිමත් කතෝලික සාහිත්‍ය වංශාවලියක් අපට උරුමව පවතිනවා. ඒ උගත් ලේඛක පරපුර ලියූ බොහෝ ගවේෂනාත්මක කතෝලික පොත පත නිසා අද බෞද්ධ ලේඛකයනට පවා ඒවා පරිශිලනය කරමින් නිබන්ධන නිකුත් කිරීමට අවකාශ ලැබී තිබෙනවා. මහාචාර්ය සුනිල් ආරියරත්නයන් මෑත කාලිනව ලියූ කතෝලික පොත පතට බෙහෙවින්ම මුල් වුයේ අර පෙන්නුම් කළ අපේම උගත් සිල්වත් ලේඛක පරපුරයි.

ආදර දුවේ පුතේ, දැන් ඔබේ අනාගතය වර්තමානය කරා ගෙන ඒමට අවශ්‍යයෙන්ම ඉටු කළ යුතු කරුණු කාරණා ගණනාවක්ම පවතිනවා. එය රඳා පවතින්නේ ඔබ අතේමයි. ළමා ප්‍රදීපය හරහා ගුණාත්මක කතෝලික ලේඛක පරපුරක් අපි බිහි කර ගත යුතුයි. ''**ළමා ප්‍රදීපය**'' පුංචි ඔබේ නිර්මාණ ජයමග විය යුතුයි. සිංහල බස කථා කරන ජනයා අතරට කතෝලික දහම් පොත පත වගේම සාහිත්‍ය කෘති පවා රැගෙන යාමට පන්හිඳ ඔබගේ සුරතට ගන්නට මං පෙත් විවර කර ගත යුතුයි.

එම නිසා ආදර දුවේ පුතේ, සිඟිති කථා ඇසුරින් හොඳ කෙටිකථා ඔබේම සුරතින් නිර්මාණය කර වැඩි වැඩියෙන් මේ සාහිත්‍ය මාසය තුළදී ළමා ප්‍රදීපයට ඒවා යොමු කරන්න. එයට පෙරමුණ ගන්න. පන්හිඳ අතැතිව ඔබ නිර්මාණ කුසලතා ලේඛන ගත කරමින් හෙට දවසේ මැනවින් පිරිපුන් කතෝලික හෙළ සාහිත්‍යයක් පෝෂණය කරන්නට පෙරට එන්න කියලා අද අපි විශේෂ ආයාචනාවක් කරනවා. ඔබව ශක්තිමත් කරන යම් පිටිවහලක් ඇත්තේ කොතැනද එයින් දිරිමත් වී ශ්‍රී ලාංකේය කිතුනු සාහිත්‍යයේ හෙට දවස වඩාත් ආලෝකමත් කරවන ඒ ආධ්‍යාත්මික බලයෙන් පන්හිඳ අතට රැගෙන අද අදම ඒ ගමන ආරම්භ කරන්න.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**



# සිරිලක කිතුනු ඉතිහාසය

**අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසිනි**

*දකුණු ඉන්දියාවේ මයිපපෝර්හි රැඳී සිටි තෝමස් තුමා අවට ප්‍රදේශවලට ද විටින් විට ගොස් කිතු දහම දේශනා කළහ. එම එක් ගමනක දී එතුමන් ශ්‍රී ලංකාවටද පැමිණි බව වාර්තා වන්නේ ය.*



**තෝමස් අපෝස්තුළුතුමා**

ක්‍රිස්තුන් වහන්සේ ස්වකීය ගෝල පිරිස ගෙන් සමු ගැනීමට පෙර අවසාන නියෝගයක් දුන්සේක. එනම් මාගේ සුබාරංචිය ලොව පුරා පතුරවන්න. යනුයි.

මේ අනුව ගෝල පිරිස වෙන් වෙන්ව ලොව පුරා පැතිර ගියෝ ය. නායක පේදුරු තුමා රෝමය බලා ගිය අතර බර්තොලමෙව් තුමා ඉන්දියාවේ උතුරු දෙස බලා ගිය බව කියැවේ. එහෙත් තෝමස් අපෝස්තුළුවරයා පැමිණියේ දකුණු ඉන්දියාවට යි.

පළමුවෙන් පර්සියාවට පැමිණි එතුමා කෙටි කලක් එහි සාර්ථකව ධර්මය ප්‍රචාරය කොට පසුව, හෙවත් ක්‍රි.ව. 52 දී දකුණු ඉන්දියාවට පැමිණියේ ය. ඒ කාලය තුළ පර්සියානු වෙළෙඳුන් ඉන්දියාව ලංකාව වැනි දකුණු ආසියාතික රටවල් සමග කිට්ටු වෙළඳ සම්බන්ධතා තබාගෙන සිටියහ. මේ නිසා ගොඩ බිමින් ''සේද මාවත'' ඔස්සේ ද මුහුදු තරණය කොට නැව් වලින් ද මෙහි පැමිණියෝ ය.

මෙසේ ශු. තෝමස් අපෝස්තුළුවරයා ද ඉන්දියාවට පැමිණ එහි විශාල පිරිසක් කිතු දහමට දිනා ගත්තේ ය. අද දක්වා ඉන්දියාවේ වැඩිම කතෝලික පිරිස ජීවත්වන්නේ දකුණේ කේරළය ප්‍රදේශයේ ය.

මෙම දකුණු ඉන්දියාවේ මයිපපෝර්හි රැඳී සිටි තෝමස් තුමා අවට ප්‍රදේශවලට ද විටින් විට ගොස් කිතු දහම දේශනා කළහ. එම එක් ගමනක දී එතුමන් ශ්‍රී ලංකාවටද පැමිණි බව වාර්තා වන්නේ ය.


# තෝමස් අපෝස්තුළුවරයාගේ ලංකා ගමන

දිගු කලක් තුළ එතුමන් මෙහි වැඩම කළ බවට කතා පැවැතියේ ය. එතුමා කොළඹ කොච්චිකඩේ උස් බිමෙක වැඩ සිට දහම් දෙසූ බවට ආදියේ සිටම පිළිගැනීමක් තිබුණ නිසා ඒ උස් බිම ''සාන්තු පිටිය'' නමින් හඳුන්වනු ලැබ ඇත. පසුව පෘතුගීසීන් විසින් ''සන් තෝම් පිටිය'' යනුවෙන් හඳුන්වනු ලැබ, අද ''සාන්තුපිටිය'' අවසාන කොට ජින්තුපිටිය බවට පෙරළී තිබේ. අද මෙහි ඇති ක්‍රිස්තියානි දෙව් මැදුර නම් කොට ඇත්තේ සාන්ත තෝමස් දෙව් මැදුර නමින් ය. දිගු කලක් තුළ වඩාත් මුඛ පරම්පරාගත කරුණක්ව තිබුණ මේ පුවත අද ඓතිහාසික සත්‍යයක් බවට පත්වී ඇත්තේ මෑතකදී පර්යේෂණවලින් ලැබී ඇති ඉතා වැදගත් ලේඛන කිහිපයක් නිසා යි. මෙහි වැදගත් ම ලේඛනය වනුයේ නිකෝෆොරෝස් කලිස්ටෝස් සන්තුපොලෝස් නමැති ඉතිහාසඥයා කැර ඇති සටහනයි.

පසු කාලීන බයිසැන්ටීන යුගයට අයත් මොහු කිතු දහමේ ආරම්භයේ සිට ක්‍රි.ව. 610 දක්වා වූ කාලයේ කිතුනු ඉතිහාසය , ග්‍රීක බසින් ලියා ඇත. කාණ්ඩ 18 ක් පුරා විහිදී යන මේ වැදගත් පුස්තකයේ ශු. තෝමස් අපෝතුළුවරයාණන් ටැප්රොබේන් (ග්‍රීක බසින් ලංකාව) වෙත පැමිණ, දහම් දෙසූ බව පැහැදිලිව සටහන් වී තිබේ.

මෙම ගත්කරු මිය ගොස් ඇත්තේ ක්‍රි.ව. 1328 දීය. මෙම ග්‍රන්ථ මාලාව පිළිග න්වා ඇත්තේ තම රජ කාලය ක්‍රි.ව. 1317 දී ආරම්භ කළ දෙවැනි අන්ඩ්‍රොනියෝකොස් අධිරජ වෙතයි. නිකේෆොරෝස් කලිස්ටෝස් සන්තු පොලෝස් කොන්ස්ටැන්ටිනෝපලයේ සුප්‍රසිද්ධ හජියා සෝෆියා කණ්ඩායමේ වියතෙකි.

මේ අනුව කිතු සමිඳුන් ගේ ගෝලයකුම දිවයිනට වැඩමකොට මෙහි දහම් දෙසූ බව සැකයෙන් තොරව අපට පිළිගත හැකිය.



# සුදුවර චරිතයක් හඳුනාගනිමු

**ක්‍රි.ව. 1656 දී චිලී දේශයේ උපන් මෙතුමිය රතු ඉන්දියානු දියණියක වූවාය. කුඩා කල සිටම ඉතා හුරුබුහුටි, ශාන්ත දාන්ත දැරියක වූ ඕ තොමෝ කුඩා කල සිටම ශු. රෝස් ද ලීමා මුනිවරියගේ දිවි මග අනුසාර කරමින් හැඳී වැඩුණේ නිව්යෝර්ක් නුවර දීය.**

ඇගේ කුඩා කාලයේදී දෙමාපිය සෙනෙහස ඈ හට නොලැබුණු අතර , ඊට හේතුව වූයේ ක්‍රි.ව. 1661 දී වසූරිය රෝගය වැළඳී තම ආදරණීය දෙමාපියන් තමා අතහැර යෑමය. ඉතා කෙටි ජීවිත මග තුළ ඈ ගතකළේ නිව්යෝක් ප්‍රදේශයේ සහ කැනඩාවේය. ඇය කරුණාවන්තව නොසැලිව හා නොමැලිව වැඩකටයුතු කළ දිරිමත් තරුණියකි. නිවාඩුවක් ලද සෑම විටම ඕ තුමිය යාච්ඤාවේද භාවනාවේ ද නිරත වූවාය. එනමුදු ඇය බෞතිස්ම ස්නාපනය ලැබුවේ වයස අවු. 20 දිය. මන්ද එකල

# ශු. කැටරි මුනිවරිය



යුරෝපිය මිෂනාරිවරු ගෝත්‍රික ජනතාව එකවර බෞතිස්ම කිරීමට තරමක් මැලි වූහ.

විශේෂයෙන් එය ජේසු නිකායික පියවරුන්ගේ ධර්මදූතික ක්‍රියා දමයක් වී තිබුනි. සිය දෙමාපියන්ගේ වියොවෙන් පසු ඇයව හා සිය සොයුරාව හදාගත්තේ සිය මාමා විසිනි. දඩයම් කරන කාලයේදී තම ගෝත්‍රික ජනතාව සමග ගමන් කරද්දීත් ඇගේ දේව භක්තිය නතර නොවීය. ඇය නිරන්තරයෙන් යාච්ඤාවේ නිරත වූ අතර ඇය විසින් කැටයම් කරන ලද කුරුසියක් සිටුවා ගෙන , ඒ ඉදිරිපිට යාච්ඤා කරන්නට වූවාය. ඇගේ ඥාතින් ඇයට විවාහ යෝජනාවක් ඉදිරිපත් කළ විට ඇය ඉතා කරුණාවෙන් හා සුහදව ඔවුන්ට දන්වා සිටියේ, ඇයගේ එකම සමිඳාණන් ජේසු සමිඳුන් බවත් කිසිදින ඔවුන් වහන්සේව අතහැර දමා වෙන කිසිදු අයෙකු හමුවේ නොයන බවත් ය.

කැටරි ගත් මේ තීරණය අනුව තම ගෝත්‍රිකයන් විසින් ඇයව ප්‍රතික්ෂේප කොට තම රළෙන් පන්නා දැමූ අතර ඒ සියලු බාධක ඔස්සේ ඕ ඉතා දිළිඳුව ජීවත් වන්නට හුරු පුරුදු වූවාය. කෙසේ හෝ ඇය නිර්භීත තීරණය ගත්තාය. ක්‍රි.ව. 1679 මාර්තු 25 වන දින ඇයට වයස අවු. 23 දී ඇගේ ආත්මික අනුශාසකයාණන්ගේ අනුමැතිය ඇතිව කැටරි තුමිය , ස්වකීය කන්‍යාභාවයේ භාරය දෙවිඳුන් ඉදිරියේ ගන්නා ලදී. රතු ඉන්දියානුවන් අතර කැටරිගේ භාරය ඔවුනගේ රටේ සිදුවූ ප්‍රථම අවස්ථාව විය. ක්‍රි.ව. 1679 ශු. සතියේ මෙතුමිය ඉතා තදබල ලෙස රෝගාතුර වූ අතර සිය මරණය බලාපොරොත්තුවෙන් සිටි ඇගේ මුවින් නික්මුණු වචනය වූයේ ''මම ස්වර්ගයට ආදරය කරමි'' කියාය. ඇගේ මරණයට පෙර මාස කීපයක් තුළ ඇය තුළ තිබූ ස්ථිර විශ්වාසයද අවංක බැහැපත් කමද, දේව කැමැත්තට යටත් වීමෙන් ඇය තුළ ඇති වූ සාමය හා ප්‍රීතිය ද පැහැදිළි ලෙස ප්‍රකාශ විය. ඇගේ මරණ මොහොතේදී ඇය විසින් උච්චාරණය කරන ලද උත්තම සහ අවංක වූ වචන ඇගේ පිරිසිදු හා දයාවන්ත මුළු ජීවිතයම අලංකාර ගීතයක සිරි ගනිමින් ඇගේ ජීවිතය සාරාංශ කොට දක්වයි. එනම් ''මාගේ ජේසුනි මම ඔබවහන්සේට ප්‍රේම කරමි'' කියා පැවසුවාය. ක්‍රි.ව. 1680 අප්‍රියෙල් 17 වන දින ඇය ස්වර්ගස්ථ වූ අතර එවිට ඇගේ වයස අවු . 23 ක් විය. ක්‍රි.ව 1980 ජුනි 22 වන දින භාග්‍යවත් II වන ජුවාම් පාවුලු ශු. පියතුමා මෙතුමිය භාග්‍යවරයට එසවූ අතර, රතු ඉන්දියානු කාන්තාවන් අතුරින් ශුද්ධවරයට ප්‍රකාශ කළ පළමු තැනැත්තිය මෙතුමිය වේ. 2012 ඔක්තෝම්බර් 21 වන දින XVI වන බෙනඩික් ශු. පියතුමා විසින් මෙතුමියව ශුද්ධවරයට එසවීමට නියමිතය. ශු. සභා මාතාව තුළ අනාථ දරුවන් ගේද , ගෝත්‍රික ජනතාවගේ ද ආරක්ෂක මුනිවරිය ලෙස මෙතුමිය නම් කර තිබේ.

**අසේල දසනායක**

## මගේ බලාපොරොත්තුව

ශුද්ධවූ පවුලේ සිස්ටර්ලා අපේ රටට ඇවිල්ලා මේ වසරේදී අවුරුදු 150 ක් සපිරෙනවා. අපේ ඉස්කෝලේ ඉගෙන ගත්තු අක්කා කෙනෙක් ළඟදී සිස්ටර් කෙනෙක් වෙනවා. ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ ඉගෙන ගන්න ලැබීමත් මට ආඩම්බරයකි. කවදා හරි දවසක මටත් ශුද්ධවූ පවුලේ සිස්ටර් කෙනෙක් වෙන්න ආසයි.


ඉමකියුලා ආදිත්‍යනි පයස්
2 ශ්‍රේණිය
ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය - බම්බලපිටිය

# ගම්පහ දිස්ත්‍රික් මේස පන්දු ශූරතාව බෝපිටිය ලොයෙලා විදුහලට



පසුගියදා ගම්පහ දිස්ත්‍රික් මේස පන්දු සංගමය මගින් ගම්පහ සිරි කුරුස විද්‍යාලයේදී පැවැත්වූ වාර්ෂික මේස පන්දු තරගාවලියේ සමස්ත ශූරතාව දිනා ගැනීමට පමුණුගම බෝපිටිය ලොයෙලා විද්‍යාලය සමත් විය.

මෙහිදී විශේෂ ශූරතා සම්මානයන් දිනා ගැනීමට ධනුෂ්ක ලක්මාල් , තරිඳු ප්‍රිමාල්, මාෂා රවිහාරි, විමුක්ති ඩේමියන්, ජූඩ් ධනුෂ්ක, සිතුම්, කාවින්ද, ෂමාල් , සඳුන් විරාජ් හා සොනාලි යන ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමත් වූහ. ශූරතාව දිනූ බෝපිටිය ලොයෙලා විදුහල් මේස පන්දු කණ්ඩායම විදුහල්පති ගරු නිශාන්ත කුරේ පියතුමා, ක්‍රීඩා ලේකම් ආචාරිණී, දිල්ෂානි මෙනවිය , කණ්ඩායම් නායිකා මාෂා රවිහාරි මෙනවිය හා ක්‍රීඩා පුහුණු කරු කුවින්ටස් ප්‍රනාන්දු මහතා ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **(ජෝ. සංගපාල ආරච්චි)**



සේයා :- ටෝනි නිශාන්ත ප්‍රනාන්දු

**මාසික සිතිවිල්ල**

**මාසික සිතිවිල්ල**

"සැප්තැම්බර් මාසය"

ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



මිනිසා කියනා දෙපා සතා
තුළ, සෙනෙහස , ආදරය
නිවී යන මොහොතක ......
යහපත්කම් නැති, ගති ගුණ
වල් වැඳීඇති නමුත්, මේ
ලෝකය තුළ, කිසිම දෙයක්
නොදත් සතුන් තුළ ,
ඇත්තේ සෙනෙහෙබර ආදරයයි. ......
ඒ සෙනෙහෙබර සත් කරුණා ගුණයෙන් ,
මේ කුරිරු මිනිසුන්ගේ, සිත්සතන් ...... වෙනස් වුවහොත්
තිරිසන් සතෙකුගෙන් වුවද .....
මිනිස් වර්ගයාට උගත හැකි දේ බොහෝය.

**සුලක්ෂනී අත්තනායක**
**11 ශ්‍රේණිය**
**සා තෙරේසා දහම් පාසල - පේරාදෙණිය.**

**අගෝස්තු මාසයේ පටන් ජයග්‍රාහී නිර්මාණයට ත්‍යාගයක් පිරිනැමේ**

පසුගිය මාසයේ මාසික සිතුවිල්ල සඳහා මේ අයත් අප වෙත සාර්ථක නිර්මාණ එවා තිබුණා.

- ශිරෝනි ප්‍රබෝධිකා පෙරේරා - සිරිහඳ දහම් පාසල තිබ්බටුගොඩ
- හිරුණි රංසිකා මල්ෂාණි - ශා. ඉසිදෝරු දහම් පාසල බොල්ලත.

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## කාමමිථ්‍යාචාරය නොකරන්න පරදාර ආලය නොකරන්න

★ හයවන සහ නව වන දේව පනත්වලට විරුද්ධව අප සිදුකරන පාප කවරේද? හය වන දේව පනත පිළිපැදීමේදී කිතුනුවකු තුළින් ප්‍රකාශ විය යුතු සාරධර්ම තුනක් ලියා දක්වන්න (සාමාන්‍ය පෙළ 2005 /02 /අ)

- ආශාවන්ට ඉඩදීම, ඉන්ද්‍රියයන් පිනවීම
- විවාහ සහකරු / සහකාරියට අවිශ්වාසවන්ත වීම
- කාමුක දේ සිතීම , බැලීම හා ඒවාට අන් අය යොමු කරවීම
- ගණිකාවන් හා ලිංගික ඇසුර පැවැත්වීම
- අසභ්‍ය පොත පත , චිත්‍රපට බෙදහැරීම හා ඊට දායකවීම
- කෘත්‍රිම පවුල් සැලසුම් ක්‍රම භාවිත කිරීම
- කාමාශාවෙන් අන් අය දෙස බැලීම
- කාමාශාවන් ඇතිවන ලෙස ඇඟ පැළඳ යාම, නිරුවත ප්‍රදර්ශනය කිරීම , ශරීරය වැසෙන සේ ඇඳුම් නොඇඳීම
- වෙනත් ස්ත්‍රීන් / පුරුෂයන් සොයා යාම (බහු භාර්යා සේවනය / බහු පුරුෂ සේවනය )
- විවාහ පොරොන්දු කඩ කිරීම
- අන් ශරීර තම තෘප්තිය වෙනුවෙන් පවරාගැනීම
- කුඩා ළමුන්ව කාමුක දේ සඳහා යොමු කිරීම
- දික් කසාදවීම සහ ඔවුන් සමඟ විවාහ වීම
- අසභ්‍ය වචන භාවිතය
- අසභ්‍ය දේ නිතර නිතර සාකච්ඡා කිරීම

## සොරකම් නොකරන්න අනුන් සතු දේ ආශා නොකරන්න

ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

★ හත්වෙනි දේව පනත කුමක් ද? • සොරකම් නොකරන්න (නික්මයාම 20/15)

★ දසවෙනි දේව පනත කුමක්ද? • අන් සතුදේ ආශා නොකරන්න

★ තම වස්තුව හේතුවෙන් තමන් ගැන පමණක් සිතා අනුන් ගැන නොසිතන අයට වන විපත පෙන්වාදීමට ජේසුස් වහන්සේ කළ උපමාව කුමක්ද? • ධනපතියා හා ලාසරස්

★ අප වස්තුව ලබාගත යුත්තේ සාධාරණවය. එය කෙසේ ද?

- අවංකව වැඩ කිරීමෙන්
- මිලයට ගැනීමෙන්
- හුවමාරුවෙන්
- තෑගි වශයෙන්
- උරුම වශයෙන්

★ ප්‍රමාණයට වඩා මිල මුදල් ඉපයීම මෙලොව යහපත් ජීවිතයක් ගත කිරීමට බාධාවකි. ඒ ඇයි ?

- අධික වෙහෙසීම නිසා ලෙඩ රෝග වැළඳීම
- අනවශ්‍ය වියදම් ඇතිවීම
- ආගම ධර්මය ඇදහීමට වේලාවක් නොමැති වීම
- අනිසි මිතුරන් ඇතිවීම
- පවුල් සබඳතා අඩුවීම
- වුවමනාවලට සීමාවක් නැතිවීම
- සියල්ල සම්පූර්ණ යැයි සිතීම

★ හත්වන සහ දසවන දේව පනත්වලට විරුද්ධව අප සිදුකරන පාප කවරේද? හත්වන දේව පනත අනුව ජීවත්වීම සඳහා ඔබ අනුගමනය කළයුතු කරුණු තුනක් ඉදිරිපත් කරන්න

- අනුන් සතු දේ සොරකම් කිරීම
- හාම්පුතා සේවකයන්ට නියමිත වැටුප ගෙවිය යුතුය
- ශ්‍රමයට සරිලන වැටුපක් නොගෙවීම / අඩු වැටුපකට වැඩ ගැනීම
- පාරිභෝගික ද්‍රව්‍ය වංචාකාරී ලෙස සකස් කර අළෙවි කිරීම
- ණය ලබාගන්නා යථා පරිදි එය ගෙවිය යුතුය
- අයථා ක්‍රම මගින් අනුන් රවටා මුදල් රැස්කිරීම
- වංචා සහගතව අන්අය සතුදේ ලබාගැනීම
- අනුන්ගේ කාලය නාස්ති කිරීම



## සිසු නායක පදක්කම් පැළඳවීම

**කළුතර, නාගොඩ ශු. මිඛායෙල් අග්‍රදූත දහම් පාසල**



කළුතර නාගොඩ නව මීසමක් ලෙස අභිෂේක ගැන්වීමෙන් පසු ප්‍රථම වරට දහම් පාසල් ශිෂ්‍ය නායක නායිකාවන් පොරොන්දු දීමේ හා පදක්කම් පැළඳවීම පසුගියදා නාගොඩ ශු. මිඛායෙල් අග්‍රදූත දේවස්ථානයේදී පැවත්වුණි.

මීසම් සේවක ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමන් අතින් සිසු දරු දැරියෝ 20 ක් ශිෂ්‍ය නායක නායිකාවන් ලෙසින් පදක්කම් ලබගත්හ. ගරු සමීර ෆොන්සේකා සොයුරුතුමා, ගරු මීරියම් පැවිදි සොයුරිය (සුරදූතික නිකායික) ඇතුළු දහම් ගුරු මණ්ඩලය මෙම අවස්ථාවට සහභාගි වූහ. **(රංජිත් නෝනිස් )**

---

## කිතුනු ළමා හමුවෙන් කතෝලික උරුමය විමසේ




**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවයෙන් සැප්තැම්බර් 09 ඉරිදා ප.ව. 5.30 සිට 5.45 දක්වා විකාශනය වන කිතුනු ළමා හමුව වැඩ සටහනෙන් කතෝලික උරුමය පිළිබඳ විමැසේ.**

**ඥානාර්ථ ප්‍රදීපය සහකාර සංස්කාරක ශිරාන් මෛත්‍රී මහතාගේ නවතම ග්‍රන්ථය වු "සාන්ත සභා මාතාවගේ නොමැකෙන උරුම" පසුබිම් කරගෙන මේ වැඩසටහන විකාශනයවේ.**

## නායකකන්ද දහම් ළමුන්ට ලේඛකත්ව හා ජනසන්නිවේදන වැඩමුළුවක්

ලේඛක හා සංනිවේදන කුසලතා ඔප් නැංවීමේ අරමුණින් වත්තල දිසාවට අයත් නායකකන්ද මීසමේ සාන්ත මරියා දහම් පාසලේ සිසු දරුවන් සඳහා ළමා ලේඛක හා සංනිවේදන වැඩමුළුවක් සැප්. මස 16 දින ඉරිදා පෙරවරු 9.30 ට එම දේවස්ථාන ශාලාවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමාගේ ආරාධන යෙන් ඥානාර්ථ ප්‍රදීපය හා ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා මෙම වැඩමුළුව මෙහෙයවනු ලබයි. මෙහි සම්බන්ධීකාරක ලෙස ජෝශප් පයස් මහතා කටයුතු කරයි.

## පයාගල ධර්මදූත ළමුන්ගෙන් ළමා ගී ප්‍රසංගයක්

උතුරු පයාගල සාන්ත ජෝසප් ධර්මදූත ළමා සමාජයට ආධාර පිණිස එහි දරු දැරියන් ඉදිරිපත් කරන "ආවර්ජනා ළමා ගී ප්‍රසංගය" 2012 සැප්තැම්බර් 16 වන ඉරුදින සවස 3.00 ට සාන්ත ජෝසප් දහම් ශාලාවේදී පැවැත්වේ.

පයාගල මීසම් සේවක ගරු නිලන්ත උඩුවක පියතුමාගේ සහයෝගයෙන් පවත්වන මෙම ප්‍රසංගයේදී සජීවක සජීවිකාවන් හා ධර්මදූත ළමෝ එක්ව ගායනය, වාදනය, හා නරතන විශේෂාංගයන් ඉදිරිපත් කරති.

කොළඹ අගරදගුරු පදවි ධර්මදූත ළමා සමාජ අධ්‍යක්ෂ ගරු කිත්සිරි තිරිමාන්න පියතුමාගේ ප්‍රධානත්වයෙන් කළුතර දිසා ධර්මදූත ළමා සමාජ අධ්‍යක්ෂ ගරු දුලීප් කමල් පියතුමන් ඇතුලු දිසාවේ ගරු පියතුමන්ගේ හා ස්වාධීන රූපවාහිනී සේවයේ ළමා වැඩසටහන් අධ්‍යක්ෂ ලක්ෂ්මන් මත්තුමගල හා මිහිර ළමා පුවත්පතේ ප්‍රධාන කර්තෘ අජිත් ධර්මසිරි යන මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් මෙය පැවැත්වේ.

**රෝහිණී කුමාරි මුවන්දෙණිය.**

**ආදර දුවේ පුතේ ළමා ඔබේ පුවත් පත ළමා ප්‍රදීපය ඔක්තෝම්බර් මසදී 04 වන උපන් දිනය සමරනු ලබයි. ළමා ප්‍රදීපය 04 වන සංවත්සර කළාපය පිළිබඳ විස්තර ඉදිරියේදී.**

**සංස්කාරක පියතුමා**

# දේව හස්තයේ සුරැකුණු ග

**ලෝකයේ මුල්වරට සඳමත පා තැබූ මිනිසා වූ ඇමෙරිකාන ජාතික නීල් ආම්ස්ට්‍රෝන් ඉකුත් අගෝස්තු 25 වැනිද මෙලොවින් සදහටම සමුගත්තේ 82 හැවිරිදි වියේදීය.**

වර්ෂ 1951 දී එවකට සෝවියට් රුසියාව හා පුරා කියා අභ්‍යවකාශ යානයක් ගුවන් ගත කළ අතර ඇමෙරිකාව එද තැති ගත්තේ ය. විද්‍යාව ආගම දහමට විරුද්ධ බවත් විද්‍යාවේ දියුණුව ආගමික විශ්වාස ඉක්මවා යන බවටත් මතයක් පැවැති සමයේ යූරි ගගාරින් බඳු සෝවියට් ගගන ගාමීන් අභ්‍යවකාශයේදී දෙවියන් වහන්සේව හමුවුයේවත්, දුටුවේවත් නැති බව ප්‍රකාශ කළේ උපහාසාත්මක හැඟීමෙනි.

එහෙත් 1969 ජුලි 20 වැනිද මුල්වරට සඳමත පා තැබූ මොහොතේ නීල් ආම්ස්ට්‍රෝං ප්‍රකාශ කළේ මිනිසකුගේ මේ කුඩා පියවර මිනිස් සංහතියේ යෝධ පිම්මක් වන බවයි. ඇමෙරිකා සෝවියට් රුසියා සීතල යුද්ධය පරයමින් දෙවියන් වහන්සේගේ මැවිල්ලේ මහත් අසිරියත් එහි අපූර්වත්වයත් දැක ගන්නට තමන් වාසනාවන්ත වූ බැව් නීල් ආම්ස්ට්‍රෝං පසුව පැවසුවේ දේව ගරු බිය මුසු හැඟීමෙනි.


නීල් ආම්ස්ට්‍රෝං සිය සගයාවූ එඩ්වින් ඕල්ඩ්‍රින් සමඟ සඳ මතට පා තබන්නට පෙර ශුද්ධවූ බයිබලයක් ඉවතට ගෙන රිදීමය කාලිස් පාත්‍රයක්ද සමඟ ජීවමාන ශ්‍රී ශරීරය හා රුධිරය ලබාගත් බව තව දුරටත් ලෝකයට රහසක් නොවේ.

1930 අගෝස්තු 05 ද ඇමෙරිකා එක්සත් ජනපදයේ ඔහියෝ ජනපදයේ වැපකොනීටා නුවර උපත ලැබූ නීල් ආම්ස්ට්‍රෝං සිය ප්‍රථම ගුවන් ගමනට එක්වන්නේ අවුරුදු හයේදීය. වයස අවුරුදු 16 දී ගුවන්යානා පැදවීමේ බලපත් ලාභියකු වන්නේ මෝටර් රථ රියදුරු බලපතක්වත් නොමැතිවය. 19 හැවිරිදි වියේදී ඇමෙරිකාන ගුවන් හමුදාවට එක්වන ඔහු 1955 දී පෘඩ් සරසවියෙන් ගගන ඉංජිනේරු උපාධිය දිනාගත්තේය. 1962 දී අභ්‍යවකාශයේ ගගන ගාමී කටයුතු වලට තෝරා ගත් නීල් ආම්ස්ට්‍රෝං නාසා ආයතනයට බැඳී වෘත්තීය පුහුණුව ලැබීය. ජෙමිනි අට යානයේ ප්‍රධාන අණ දෙන්නා වූ ඔහු ජෙමිනි 11 යානයේ ආධාරක නියමුවකු විය. ඇපලෝ අට යානාවේ සහයක නියමුවකු වු ඔහු මේ සියලු කටයුතු වලින් ලත් පළපුරුද්ද වෘත්තීයමය කුසලතාවය සමගින් දෙවියන් වහන්සේ කෙරේ දැක්වූ ගරු බිය හා දේව හස්තය තුළ යැපෙන බව පිළිගැනීමේ අසාමාන්‍ය ගුණය නිසා සඳමත පා තබන පළමු මිනිසා බවට ඔහුව තෝරා ගැනීමට නාසා ආයතනය තීරණය කළේය.

එද ඇපලෝ 11 යානයන් සඳ තරණය කරමින් සිටි මොහොතේ ස්වයංක්‍රියව ක්‍රියාත්මක වෙමින් තිබූ චන්ද්‍ර යානය සඳේ ගල් පර්වත සහිත ස්ථානයකට පතිත වීමට යන බව දැනගත් නීල් ආම්ස්ට්‍රෝං වහාම ඒ බැව් පාලක මැදිරියට දැනුම් දී යානයේ පාලනය සියතට ගත්තේය. ක්‍රමානුකූලව වඩාත් සුදුසු ස්ථානයක් නිරීක්ෂණය කළ ඔහු එම ස්ථානයට යානය නිරුපද්‍රිතව ගොඩ බැස්සවිය. එඩ්වින් ඕල්ඩ්‍රින් ඒ ගැන කියන්නේ සඳ තරණයේදී නීල් ආම්ස්ට්‍රෝං සිය කණ්ඩායම් නායකයා ලෙස සැබෑ නායකත්ව ගුණාංගයන්ගෙන් මෙන්ම තැනට සුදුසු නුවණින් කටයුතු කිරීමේ හැකියාවෙන් පසුවූ බවයි.


පුරා පැය දෙකකට අධික කාලයක් සඳමත ගත කළ ඔහු ආපසු පෙරළා පැමිණීමේදීද එවැනිම



**මුල්වරට සඳමත පා තැබූ මොහොතේ නීල් ආම්ස්ට්‍රෝං ප්‍රකාශ කළේ මිනිසකුගේ මේ කුඩා පියවර මිනිස් සංහතියේ යෝධ පිම්මක් වන බවයි. ඇමෙරිකා සෝවියට් රුසියා සීතල යුද්ධය පරයමින් දෙවියන් වහන්සේගේ මැවිල්ලේ මහත් අසිරියත් එහි අපූර්වත්වයත් දැක ගන්නට තමන් වාසනාවන්ත වූ බැව් නීල් ආම්ස්ට්‍රෝං පසුව පැවසුවේ දේව ගරු බිය මුසු හැඟීමෙනි.**

# ගනගාමියා නීල් ආම්ස්ට්‍රෝං



තත්වයකට මුහුණ දුන්නේය. ඇපලෝ 11 අභ්‍යවකාශ යානයෙන් ආපසු පැමිණෙමින් සිටියදී මතුවූ පරිගණක දෝෂයක් නිසා යානාව නියමිත ස්ථානයට ගොඩ බැස්සවීමට නොහැකිව එය අයාලේ ගමන් කරන්නට යොමුවන තත්ත්වයක් මතුවිය එහිදී වහා ඉදිරිපත් වූ නීල් ආම්ස්ට්‍රෝං මහ විනාශයක් සිදුවන ඉදිරි විනාඩි කිහිපයේදී යානාව සිය පාලනයට නතු කරගෙන අවසාන තත්පරය දක්වා මීටරයෙන් මීටරය එය හැසිරවූ ආකාරය සියල්ල රොබෝවරුන්ට සිදුකළ හැකියැයි සිතූ වකවානුවක මිනිස් මනසේ මහිමය මුළු ලොවටම ප්‍රදර්ශනය කළ අවස්ථාවකි. ඉතා අවදානම් සහිතවූත් තත්පරයක පමාවෙන් සියල්ල උඩු යටිකුරු වී ඇපලෝ 11 යානය සමග සිය ජීවිත ද විනාශයේ මුවවිටට වැටෙන්නට ගිය මොහොතක දේව හස්තය තුළ යැපෙන නිහතමානි නායකයකු නිසා සියල්ල වෙනස්වූ අන්දම නාසා බලධාරීන්ටද සීතා ගැනීමට අසීරු වූ ජයක්ම විය.

නීල් ආම්ස්ට්‍රෝං ඒ විනාඩි කිහිපයේදී දේව හස්තය තුළ යැපෙමින් කටයුතු කළ ආකාරය ගැන හුස්ටන් පාලක මැදිරියෙන් පළවූ පැසසුම් වලින් මැනවින් ප්‍රත්‍යක්ෂ විය. ‘‘මෙහෙ සියලු දෙනා තැති ගෙන සිටියේ අපට හුස්ම වැටුනේ දැනුයි. බොහොම ස්තූතියි’’ විද්‍යාවේ පරතෙරට ගිය මහා විද්‍යාඥයෝ නීල් ආම්ස්ට්‍රෝංට කීහ.

හැටේ දශකයේ අවසානයේ සිදුවූ සඳ ගමන මුළු ලෝකයම සතුටින් කුතුහලයෙන් එකලු කළ අවස්ථාවකි. ඔවුන් ආපසු පෘථිවි තලයට ගොඩ බැසීමෙන් පසුව ඇමෙරිකාන වෙළෙඳ ලෝකය බලා සිටියේ සිය ග්‍රහණයට ඔවුන් නතුකර ගෙන සල්ලි ගස් හොල්ලන්නටය. එඩ්වින් ඕල්ඩ්‍රින් මෙන්ම මයිකල් කොලින්ස් ඔවුනගේ නුල් සුත්තර වලට දැනුවත්ව හෝ නොදැනුවත්ව ගොදුරු වුවද නීල් ආම්ස්ට්‍රෝං සඳට පා තබූ මුල්ම මිනිසා වුවද නිහතමානී ලෙස වෙළෙඳ ගැට මඟ හැරියේය. අවම වශයෙන් ස්වකීය චරිතාපදානය හෝ පළ කරන්නට අවසර නොදුන් මේ සඳ ගගන ගාමියා සිය අත්සන උපයෝගි කර ගනිමින් කුට වෙළෙඳුන් ජාවාරම් කරන බව අසා කම්පා වුයේය.

1994 වර්ෂයේ පටන් කිසිදු සමරු පොතක ඔහු අත්සන් තැබුවේ නැත. එම පිටු අධික මිළ ගණන් වලට අලෙවි කරමින් මුදල් ඉපයීම ඔහු පිළිකුල් කළේය. වරක් ඔහු සිය කොන්ඩය කපන කරණවෑමියාට විරුද්ධව නඩු පැවරුවේ නීල් ආම්ස්ට්‍රෝං ගේ හිසකෙස් රොදක් ඩොලර් තුන්දහසකට අලෙවි කළ බව අසා ඇති වූ කම්පාවද හිතේ දරා ගෙනය. ප්‍රසිද්ධිය තමන් පසුපස එද්දිත් ඉතා නිහඬව නිහතමානීව අප්‍රසිද්ධියේ විසීමට කැමැත්තක් දැක්වූ මේ අපූර්ව ගගන ගාමියා 2012 අගෝස්තු මස මුල බයිපාස් සැත්කමකට බඳුන්විය.

**නීල් ආම්ස්ට්‍රෝං ඒ විනාඩි කිහිපයේදී දේව හස්තය තුළ යැපෙමින් කටයුතු කළ ආකාරය ගැන හුස්ටන් පාලක මැදිරියෙන් පළවූ පැසසුම් වලින් මැනවින් ප්‍රත්‍යක්ෂ විය. “මෙහෙ සියලු දෙනා තැති ගෙන සිටියේ අපට හුස්ම වැටුනේ දැනුයි. බොහොම ස්තූතියි” විද්‍යාවේ පරතෙරට ගිය මහා විද්‍යාඥයෝ නීල් ආම්ස්ට්‍රෝංට කීහ.**

ඉන් ඇතිවූ සංකූලතා හේතුවෙන් 82 හැවිරිදි නීල් ආම්ස්ට්‍රෝං මෙලොව දිවියට සමුදී සඳ සාමය පතා නික්ම ගියේ ලෝකයටත් ඇමෙරිකාවටත් නිහඬ පාඩම් රැසක් කියා දෙමිනි. ඉන් වැදගත්ම පාඩම නම් කෙන්දක් තරම් දෑ කර කන්දක් තරම් ප්‍රසිද්ධියක් ලබා ගනිමින් පුරසාරම් දෙඩන ඊනියා විද්වතුන්ට නිහතමානී බවත් , නිහඬ බවත් මේ යැයි යන්නය.

**නීල් ආම්ස්ට්‍රෝං පරපුරේ ගගන ගාමීන් - දේව ගරු බිය තුළ දිවි ගෙවූ අයුරු ඊයෙට අදට පමණක් නොව හෙටටද කදිම ආදර්ශයකි.**

**ශිරාන් මෛත්‍රි**

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක : 69**

## PREPOSITIONS (නිපාත පද)

**PREPOSITIONS** (ප්‍රිපොසිෂන්ස්) හෙවත් නිපාද පද කියන්නෙ මොනවාද යන්න විමසා බලමු.

මේ වාක්‍ය දිහා බලන්න
1. I am looking ***at*** him. (අයැම් ලුකිං ඇට් හිම්)
මම ඔහු දිහා බලා ඉන්නවා.

2. The book is ***on*** the table.
(ද බුක් ඉස් ඔන් ද ටේබල්)
පොත මේසය උඩය.

3. The Pen is ***in*** my Pocket.
(ද පෙන් ඉස් ඉන් මයි පොකට්)
පෑන මගෙ සාක්කුවේ.

බලන්න ඉහත වැකි වල යටින් ඉරි ඇද ඇති වචන දිහා.
***at*** (ඇට්), ***on*** (ඔන්), ***in*** (ඉන්) යන වචන ඒ වැකිවල යෙදිල තියෙන්නෙ ඇයි කියලා ඔබට වැටහෙනවාද? මේ වචන යෙදිල තියෙන්නෙ *වාක්‍යයක් ඇතුලත අඩංගු වන කරුණු දෙකක් අතර ඇත්තෙ මොන වගේ සම්බන්ධයක්ද කියල පෙන්වා දීමටයි.*

1. මම ඔහු දිහාවෙ බලාගෙන ඉන්නවා. මම සහ ඔහු අතර තියෙන සබඳතාවයේ ස්වභාවයයි දිහාවෙ (at) කියන වචනෙන් පිළිබිඹුකරන්නෙ.

2. පොතයි මේසෙයි අතර තියෙන සම්බන්ධය මොකක්ද?
පොත මේසෙ උඩ.
(on කියන්නෙ සම්බන්ධය ප්‍රකාශ කරන වචනය)

3. පෑනයි සාක්කුවයි අතරෙ තියෙන්නෙ මොන වගේ සුහද බවක්ද කියන එක 'in' යන වචනෙන් කියවෙනවා. සාක්කුව "ඇතුලෙ". අන්න ඒ වගේ වැකියක තියන ඒ වගේ වචන වලට කියන්නෙ PREPOSITIONS (ප්‍රිපොසිෂන්ස්) කියල. සිංහලෙන් කියන්නෙ නිපාත පද.

අපි මේ නිපාත පද ගැන ටිකක් දැනුවත් වෙමු.

මේ නිපාත පද හෙවත් PRE OSITIONS සමහර අවස්ථාවලදී තනි වචනයක් වශයෙනුත්, සමහර අවස්ථාවලදී වචන කීපයක එකමුතුවක් ලෙසත් දකින්න ලැබෙනවා. අපි මුලින්ම මේ තනි වචනෙ Prepositions ගැන දැනුවත් වෙමු.

පහත සඳහන් වාක්‍ය වල යටින් ඉරි ඇද ඇති වචන සේරම Prepositions. ඒ හැම එකෙන්ම කෙරෙන්නේ එම වාක්‍ය ඇතුලෙ ඇති යම් දේවල් දෙකක් අතර ඇති සම්බන්ධතාවය මොන වගේ එකක්ද කියල හඳුන්වා දීමයි.

1. The cat is looking ***at*** the rat.
(ද කැට් ඉස් ලුකිං ඇට් ද කැට්)
බලලා මීයා දෙස බලා සිටී.

2. Kamal walked ***across*** the street.
(කමල් වොක්ඩ් එක්‍රොස් ද ස්ට්‍රීට්)
කමල් පාර හරහා ඇවිද්දා.

3. Sunils is running ***about*** the tree.
(සුනිල් ඉස් රනිං අබවුට් ද ට්‍රී)
සුනිල් ගහ වටේ දුවමින් ඉන්නවා.

4.He came ***along*** the main road.
(හී කේම් එලෝන්ග් ද මේන් රෝඩ්)
ඔහු ප්‍රධාන මාර්ගය දිගේ ආවා.

5. Seetha chased Kamani ***around*** the house.
(සීතා චේස්ඩ් කමනි එරවුන්ඩ් ද හවුස්)
සීතා කමනිව ගේ වටේම එලෙව්වා.

# සැබෑ මනස්ථාපනයකින් ජීවිතයේ වෙනසක්......

**කුඩා කාලයේ සිටම උඩු සිතට කා වැදුනු සිතිවිලි යටි සිතේ තැන්පත් වෙයි. ඒවා ධානාත්මක පණිවිඩ නම් ධන සිතිවිලි ලෙසත්, ඍණ පණිවිඩ නම් ඍණ සිතිවිලි ලෙසත් යටි සිතේ තැන්පත් වෙයි.**

**පුංචි කාලයේ සිටම අත්විඳි සතුට, ආදරය, කීර්තිනාම , ජයග්‍රහන උසස්වීම් අගය කිරීම් ආදිය ධනාත්මක සිතිවිලි ලෙසත් වේදනා, කළකිරීම් , බිය සැක, චෝදනා, බැනුම්, ඊර්ෂ්‍යා, වෛරය ආදිය ඍණ සිතිවිලි ලෙසත් යටි හිතේ තැන්පත්ව ඇත.**



**ගරු ශිරෝමා ප්‍රනාන්දු පැවදි සොයුරිය විසිනි**

ජේසු සමිඳුන් තම දූත කාර්ය ආරම්භ කළේ 'මනස්ථාපනය වී සුභ ආරංචිය අදහා ගන්න' යනුවෙනි.

**තමා තුළ ධනාත්මක හෝ සෘණාත්මක ආකල්ප ඇති වන්නේ කෙසේද?**

සිතට පණිවිඩ එන්නේ සිතිවිලිවලින්ය. සිත දෙයාකාරයි. උඩු සිත හා යටි සිත යනුවෙනි. සිග්මන් ෆ්‍රොයිඩ් කියන මනෝ විද්‍යාඥයා සිත අයිස් කන්දකට සමාන කරනවා. අයිස් කන්දකින් මතුපිටට පෙනෙන්නේ 1/10 ක් ලෙසත් , 9/10 ක්ම තියෙන්නේ මුහුදේ යට සැඟවිලායි. මිනිසාගේ උඩුසිත 1/10 ක් ලෙසත් යටි සිත 9 /10 ක් ලෙසත් ඔහු පෙන්වා දෙයි.

උඩු සිතේ සිතිවිලි ගැන තමා දන්නවා. නමුත් යටි සිතේ සිතිවිලි ගැන කවුරුත් නොදනියි. සාමාන්‍යයෙන් උඩු සිත පණිවිඩ ගෙන යටි සිතට දෙයි. උදාහරණයක් ලෙස තමා විශිෂ්ට ලෙස විභාගය සමත් වූ විට අන් අයගෙන් ලැබෙන සුභ පැතුම් නිසා ඇතිවූ සතුට යටි සිතේ තැන්පත් වෙයි. නැතිනම් දෙදෙනෙකු අතර ආරවුලක් ඇති වූ විට වෛරය හා තරහව යටි සිතේ තැන්පත් වෙයි.

මෙලෙස කුඩා කාලයේ සිටම උඩු සිතට කා වැදුනු සිතිවිලි යටි සිතේ තැන්පත් වෙයි. ඒවා ධානාත්මක පණිවිඩ නම් ධන සිතිවිලි ලෙසත්, සෘණ පණිවිඩ නම් සෘණ සිතිවිලි ලෙසත් යටි සිතේ තැන්පත් වෙයි. පුංචි කාලයේ සිටම අත්විඳි සතුට , ආදරය, කීර්තිනාම , ජයග්‍රහන උසස්වීම් අගය කිරීම් ආදිය ධනාත්මක සිතිවිලි ලෙසත් වේදනා, කළකිරීම් , බිය සැක, චෝදනා, බැනුම්, ඊර්ෂ්‍යා, වෛරය ආදිය සෘණ සිතිවිලි ලෙසත් යටි හිතේ තැන්පත්ව ඇත.

යටි සිතේ කුඩා කාලයේ පටන් තැන්පත්ව ඇති සිතිවිලි පෞරුෂ වර්ධනය කෙරෙහි බොහෝ සෙයින් බලපායි. ධනාත්මක සිතිවිලි වැඩි ප්‍රමාණයක් යටි සිතේ තැන්පත් වී ඇත්නම් ධනාත්මක පුද්ගලයකු බවට හෝ සෘණ සිතිවිලි යටි සිතේ වැඩිම ප්‍රමාණයක් තැන්පත් වී ඇත්නම් සෘණ පුද්ගලයකු බවටත් පත්වෙයි. සෘණ සිතිවිලි ධන සිතිවිලි බවට පත්කර ගන්නේ කෙසේද?

පුංචි කාලයේ පටන් තමාගේ සිතට තදින්ම කා වැදී ඇති අතීත සිදුවීම් මතක්කර ගන්න. එම සිදුවීම් තුළින් තම යටි සිතේ තැන්පත් වී ඇති සෘණ සිතිවිලි සටහන් කර ගන්න. පෞරුෂය වර්ධනය වී ඇත්තේ එම සෘණ සිතිවිලි සමග බව අවංකව පිළිගන්න.

| **ධනාත්මක ආකල්ප** | **සෘණාත්මක ආකල්ප** |
|---|---|
| • තමා දෙසත්, ලෝකයා දෙසත් අන් අය දෙසත් සුභවාදීව බලයි. | • තමා දෙසත්, ලෝකයා දෙසත් අන් අය දෙසත් අසුභවාදීව බලයි. |
| • හොඳ දෙය අගය කරයි | • හොඳ දෙය අගය කරනවාට වඩා විවේචනය කරයි. |
| • සියලු දෙනා සමග යහපත් සබඳතා ගොඩනගා ගනියි. | • සබඳතා ඉක්මනින් බිඳවැටෙයි, තරහකාරයින් වැඩියි. |
| • ආදරය කරයි සමාව දෙයි | • පළිගැනීමට නැඹුරුයි, දෝෂාරෝපනය |
| • අගය කරයි | • ඊර්ෂ්‍යාකාරයි |
| • සංසන්දනය නොකරයි | • සෑම දෙයක්ම තමන් හා සංසන්දනය කරයි |
| • තම වරද සතුටින් පිළිගනියි | • වරද අන්අය පිට පවරයි නැතිනම් එය අසතුටින් පිළිගනියි. |
| • අන් අයගේ සිත් රිදවන්න කැමති නැත. | • අන් අයගේ සිත් රිදවා සතුටු වෙයි. |

ඉතිරිය 14 පිටුවේ ....

ළමා ප්‍රදීපය

ක්‍රිස්තු වර්ෂ 2012 සැප්තැම්බර් 10 සඳුදා

# පරිසරයේ අසිරිය



**උපේකා නයන කුමාරි**
05 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල - හාල්දඬුවන

### පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**නයෝමි මධුශානි**
10 ශ්‍රේණිය
සිරිකුරුස දහම් පාසල - මුන්නක්කරය
(මහවීදිය මීගමුව )



**අනන්ත ප්‍රභාෂ්වර කෲස්**
09 ශ්‍රේණිය
ශු. පවුලේ දේවස්ථානය - බිබිල




**ඩොලින් චමෝද්**
07 ශ්‍රේණිය
සාන්ත සේවියර් දහම් පාසල ,
කඩුගන්නාව



**ක්‍රිස් හිරුන් පීරිස්**
03 ශ්‍රේණිය
සාන්ත තෙරේසා දහම් පාසල , තල්විල



**හිරුෂිකා නිස්සංක**
07 ශ්‍රේණිය
දිව්‍ය හෘදය දහම් පාසල - දාගොන්න



**දිනිති ප්‍රභා**
07 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල, තොඩුවාව



**රොවින්දි තන්තිරිආරච්චි**
04 ශ්‍රේණිය
ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ 07




# දෙවිඳුන්ගේ ප්‍රේමය අත් දකිමු

**ආදරණීය දුවේ පුතේ, පසුගිය ලිපිය තුළින් මා අවධානය යොමු කළේ සැමටම හොඳින් සැලකීම සහ දේව ප්‍රේමය පිළිබඳව. මේ සතිය තුළදීත් මේ පිළිබඳව තවත් කරුණු කීපයක් මා බෙදා ගන්න කැමතියි.**

ඔබත් මාත් අපි සියලු දෙනාම ආගම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයීමේදී, දේවස්ථානයේ දිව්‍ය පූජාවන් වලට හැඳින්වීම් සහ විශ්වාසකයන්ගේ යැදුම් සකස් කිරීමේදී කථාවක් පවත්වන අවස්ථාවන් වලදී, ප්‍රේමය, ආදරය, කරුණාව,



මෛත්‍රිය, සමාව දීම , තේරුම් ගැනීම වැනි වදන් බොහෝ වාර ගණනාවක් ලියා ඇති එවගේම කථා කරලත් ඇති.

එහෙත් එදිනෙද ජීවිතයේ විවිධ සිදුවීම් මතක් කර බැලුවහොත් අපිට අනික් අයගෙන් ලැබිය යුතු ආදරය , කරුණාව හා දයාව ලැබෙනවාද, අපි අනිත් අයට ලබා දිය යුතු ආදරය කරුණාව , දයාව ලබා දෙනවාද? යන පැන විමසුවහොත් ''නැත'' යන පිළිතුර ලැබිය හැක. අපි බොහෝ විට හුරු පුරුදු වී ඇත්තේ අපි කැමති අපි ආස අයට ප්‍රේම කරන්න. අපිට හිරිහැර කරන , අපිට පීඩා කරන අයගෙන් ඈත්ව දිවි ගෙවන්න. ඔවුන් පිළිබඳව වෛර සහගත ආකල්පයකින් දිවි ගෙවන්න. ඒත් ප්‍රේමයේ මහා බලයෙන් ඔවුන්ගේ ජීවිත වෙනස් කරන්න පුළුවන් නම් කොයිතරම් හොඳද? දෙවියන් වහන්සේ සුදනන්ට මෙන්ම දුදනන්ටද වැසි වස්වන සේක. ඉර පායවන සේක. මෙබඳු වදන් සිතේ ධාරණය කරගෙන දිවි ගෙවන්න ඇත්නම්. මීට වසර කීපයකට පෙර මා ඇඩි ලෙස රෝගාතුර වී ශල්‍යකර්මයක් සඳහා රාගම රජයේ රෝහලට ඇතුළත් වුනා. එම රෝහලේම නේවාසිකව ප්‍රතිකාර ලබා ගත් වාට්ටුවේ සියලුම වෛද්‍යවරු නිර්වින්දන වෛද්‍යතුමිය සහ හෙද කාර්ය මණ්ඩලය ඇතුළු සියලුම දෙනා මහත් කැපවී-මෙන් සහ ආදර-යෙන් කටයුතු කළ අන්දම නම් ඉතාම ප්‍රශංසනීයයි. මේ අය අතුරින් මගේ හදවතේ තාමත් රැඳී ඉන්න විශේෂ තැනැත්තියක් ඉන්නවා. ඇය හෙද සොහොයුරියක්. ඇය රෝගීන්ට දක්වපු ආදරය කරුණාව අප්‍රමාණයි. ඇය එවකට පුහුණුව ලබන හෙද සොහොයුරියක් ඇය හනික රෝගීන් වෙත පැමිණ ආදරයෙන් කතා කොට කළ හැකි සියලු උපකාර කිරීමට ඉදිරිපත් වීම සැබවින්ම පැසසිය යුතුය.

වෛද්‍ය ප්‍රතිකාර වාගේම මේ සියලුම දෙනා දක්වපු ප්‍රේමයේ මහා බලයෙන් ශල්‍යකර්මය බරපතළ වුවත් ඉතාම ඉක්මනින් සුවවී නිවස කරා පැමිණීමට මා වාසනාවන්ත වුවා.


**ජී.ඒ. නිමාලි ප්‍රනාන්දු**
**ගුරු මව**

## මගේ ජීවය ඔබයි සමිඳුනි

සමිඳුන් තුරුලේ තනි වූ මා.
මව් කිරි තුළ මවගේ රුහිරුත්,
දරු සෙනෙහස තුළ මවගේ තෘප්තියත්, ඇති වන්නාවූ
නිරතුරු වම, සමිඳුන් හට තුති ගී ගැයේවා ......
එහෙත් සමිඳේ ඔබ පමණය මගේ ජීවය,
මා තුළ ජීවිතාන්තය දක්වා සිටින්නාවූ ,
යැයි මා හට නිරන්තරයෙන් දැනේ ...... සමිඳේ
මේ විශ්වය හා පොළෝ තලය තුළ ,
මං පෙත් වල, වීදි වල දුක සේ සැතපී සැතපී සිටිනා ,
බිලිඳුන් කුමට ද මේ ලොව හට සමිඳේ........
සමිඳේ ඔබ පමණය සරණේ සද සුර සැප විඳිනට ,
ආදරය සෙනෙහස ලබනට , තුරුළු කරගන්න මා ඔබේ
දෝතින්ම...... කඳුළු කැට වැටෙන මගෙ දෑසින්
තනි වී නැත මා ඔබේ නාමෙන්,
මව් සෙනෙහස නොලබමි සැම විට,
එහෙත් දෙවිඳුණෝ මා තුළය.

**සදුනි උපේක්ෂිකා**
**12 ශ්‍රේණිය**
**ශා. ඉසිදෝරු දහම් පාසල - තිබ්බටුගොඩ**

# ප්‍රහේළිකා අංක 32



සැකසුම

තිළිණි දුතිකා පෙරේරා

**හරහට**

1. මෙම කාලයේදී විශේෂයෙන් ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය සිහි කරනු ලබයි.

4. අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් අතරින් උන්වහන්සේ ප්‍රේම කළ තැනැත්තා උන්වහන්සේගේ .......... ළංව හාංසි වී සිටියේය මෙහි හිස්තැනට සුදුසු වචනය.

6. ක්‍රිස්තුන් වහන්සේ බොහෝ අවස්ථාවලදී මොවුන් වැඟී සිටි අයට සුවය ලබාදුන් සේක.

8. ක්‍රිස්තුන් තම කන්ද උඩ දේශනයේදී ........... හා විපත පිළිබඳව විස්තර කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

9. ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රාවකයන් අතරින් ජුදස් පොදු ........... පසුම්බිය බාරව සිටියේය මෙහි හිස්තැනට සුදුසු වචනයට සමාන වචනයකි.

**පහළට**

1. අල්ලස් ගැනීමෙන් මෙය දූෂණය වන බව ධර්ම දේශකයා පවසයි.

2. ක්‍රිස්තුන් වහන්සේව කුරුසියේ ඇණ ගසන පිණිස ........... පිටිය යන අර්ථය ඇති ''ගොල්ගොතා'' නම් ස්ථානයට ගෙන ගිය සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ඇණ ගැසූ පසු මද්දහනේ සිට අපරභාග .............. පමණ උන්වහන්සේ ''මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මන්ද?'' කියා මොර ගැසුහ. මෙහි හිසතැනට සුදුසු වචනය

5. එක් ධනවත් ප්‍රධානියෙක්, උන්වහන්සේට කථා කොට, ''............. ගුරු දේවයනි, සදාතන ජීවිතය උරුම කර ගන්නට මා කුමක් කළ යුතුදැ''යි ඇසිය. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. ජෙරමියා දිවැසිවරයාට දෙවියන් වහන්සේ මෙසේ වදාළ සේක. ''ඊශ්‍රායෙල් ජනයෙනි, ......................... කරු අතේ තිබෙන මැටි පිඬක් මෙන් නුඹලා මාගේ අතේ සිටින්නාහුය. හිස් තැනට සුදුසු වචනය.

(මෙම ප්‍රහේළිකාව පිරවීමේදී පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. මාක් 15/22, , ශු. ලූක් 6/ 20 , 18/18 , ශු. ජුවාම් 13/ 23 , 13 / 29 , ජෙරමියා 18 /6 , ධර්මදේශකයා 7 / 7)

**ප්‍රහේළිකා අංක 32 සඳහා පිළිතුරු ලබන සතියේ**

## සැබෑ මනස්ථාපනයකින් .....

11 පිටුවෙහි ඉතිරිය

මින් ඉදිරියට යටි සිතේ ධන සිතිවිලි පමණක් තැන්පත් කර ගන්න උත්සහ කරන්න. සෘණ සිතිවිලි ඇති වන විට අවදියෙන් සිට සෘණ සිතිවිලි ඉවත් කරන්න.

මෙය එදිනෙදා සිදුවීම් තුළින් තමන් විසින් පුද්ගලිකව කළ යුතු කාර්යයකි. උනන්දුව උත්සාහය, ධෛර්ය හා අධිෂ්ඨානය අවශ්‍යයි, යාච්ඤාව හා භාවනාව අත්‍යවශ්‍යයි. මා තුළ බලගතු දෙවිඳුන්ව අත්දකීමක් කර ගනිමින් උන්වහන්සේගෙන් ශක්තිය ලබා ගන්න.

### තමා තුළ බලගතු දෙවිඳුන්

රූපවාහිණිය දෙස බැලුවොත් තමන්ට පෙනෙන්නේ ප්ලග් එක, සුවිච් එක, රූපවාහිණිය විතරයි. නමුත් සුවිච්ය දාපුවාම ලෝකයේ සිදුවන ඕනෑම දෙයක් දැක ගත හැක.

මෙය පුදුමයක් නොවේද? මෙය සිදුවන්නේ කෙසේද කියා සිතා තියෙනවාද? මෙයට හේතුව පෙනෙන රූපවාහිණිය තුළ විද්‍යුත් බලයක් ක්‍රියාත්මක වීමයි. මෙලෙස ගස් කොළන් , සතුන්, මිනිසුන් හා ජීව අජීව සෑම මැවිල්ලක් තුළම මිනිස් ඇසට හා මනසට හසු නොවන නොපෙනෙන බලයක් ක්‍රියාත්මකයි. මැවිල්ල තුළ බලගතු බලය නම් සර්ව බලැති දෙවි පියාණන් වහන්සේයි. උන්වහන්සේට කරන්නට බැරි කිසිවක් නැති බව ජේසු සමිඳුන් තුළින් ලොවට ප්‍රකාශ කළ සේක.

ශු. පාවුළු තුමා මෙය ''සත්‍යමය අභිරහසක්'' ලෙස මෙසේ ලොවට එළිදරව් කර ඇත. එම අභිරහස නම් ජේසු සමිඳුන් තමා තුළ ජීවමානව , බලගතු ලෙස වැඩ සිටින බවයි. චණ්ඩ මාරුතයට හසු වූ ගෝලයන්ගේ බෝට්ටුවේ උන්වහන්සේ නිදා සිටියා සේ තමා තුළත් ජීවත්වෙයි. මෙය අදහාගෙන උන්වහන්සේව අයිති කර ගන්නා තරමට උන්වහන්සේ තමා තුළ බලගතු වෙයි. තමා තුළ බලගතු වන තරමට පෞරුෂය ධනාත්මක වෙයි. උන්වහන්සේගෙන් ඈත්වී ජීවත්වන තරමට පෞරුෂය සෘණාත්මක වෙයි. සෘණ සිතිවිලිවලින් තම පෞරුෂය වර්ධනය කර ගැනීමේ අවසාන ප්‍රතිඵලය ඇතැම් විට නිදන් ගත රෝගවලට හේතු කාරකද, නැතිනම් මානසික රෝගියකු බවටද පත් විය හැක. මනස්ථාපනය වී ජීවිතය වෙනස් කර ගන්න. සෘණ සිතිවිලි ධන සිතිවිලි කර ගන්න එවිට තම ජීවිතය සාර්ථක වේ. නිරෝගිමත් වේ. සුවපත් වේ.

## ඔබ එළිදක්වන පොත්පත් වලට අපෙන් ඉඩක් ...

ඔබ පාසලේ, මිසමේ දහම් පාසලේ එළි දක්වන, ළමා පොත්, සඟරා හා පුවත් පත් පිළිබඳව තොරතුරු අපට ලියා එවන්න. ඒවා ළමා ප්‍රදීපයේ පළ කිරීමට අපි සූදානම්. එම විස්තර පහත ලිපිනයට යොමු කරන්න.

**"පොත් පත්"**

ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත - කොළඹ 08


රජකුමාරයයි කිඳුරු කුමාරියයි
කතාව ආනන්ද කල්දේරා
දෙබස්, චිත්‍ර: ඇස්.ඒ.පී. සපුආරච්චි
කුමාරිට දැන්නම් හරිම සතුටුයි... කොහොමහරි... කුමාරයාව.. දකින්න ලැබුණානෙ
ඒ වෙලාවෙ කිඳුරු කුමාරිගෙ යාළුව කුමාරිට කතා කරලා මෙහෙම කිව්වා..
14
කුමාරී දැන් කිසිදේකට බය වෙන්න එපා.. දැන් එළිය වැටෙන්නත් ළඟයි..! කුමාරයාට ඇහැරෙන්න කලින් අපි මෙතනින් පිටවෙමු..!
කුමාරිට ආයෙත් දුක හිතුනා.. එයා කුමාරයාව තනි කරලා යන්න කොහෙත්ම කැමති වුනේ නෑ.. මුහුදු මතුපිටට එළිය වැටෙන්ඩ පටං ගත්තා.. ඒ නිසා දෙදෙනාම කිඳුරු රාජධානිය වෙත පිහිනා ගියා...
ටික වෙලාවකින් කුමාරයාට සිහිය ආවා. වට පිට බලනකොට අමුතුම තැනක ඉන්න බව දැනුනා.. මුහුදු මැද්දෙ ගලක් උඩ අලංකාර පුංචි මාළිගාවක් කිසිම අඩු පාඩුවක් නැතුව හැම දෙයක්ම මාළිගාව ඇතුලෙ තියෙනවා...
අ.. මම මේ කොහෙද ඉන්නේ
මම කොහොමද මෙතනට ආවෙ.. මුකුත් මතක නෑ
කුමාරයාට මුල ඉඳලා හැම දෙයක්ම මතක් වුනා
ම්..කෝ මගේ නැව.. මගේ යාලු කුමාරවරු ! අර ලස්සන දිය කිඳුරියො ටික ඒ ගොල්ලො එක්ක හිටපු ලස්සන කිඳුරු කුමාරි...
මගෙ රටේ ඉඳලා යාළුවොත් එක්ක නැව් නැගලා ඇවිත් මුහුද මැද්දෙ අතරමං වුනා.. ඊට පස්සෙ දිය කිඳුරියො ටික හමුවුනා.. එදා රෑ... මහ කුණාටුවක් ඇවිත් අරේ නැව විනාශවුනා..
ඊට පස්සෙ මොකද වුනේ..

හයවන කොටස

*දඟකාර ළමයෙකු හොඳ ළමයෙකු වූ කතාව.......*

සැකසුම : තිළිණ අලහකෝන්

# නිවාඩුව

